www.agaram.lk

NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 12 |
|---|---|---|

## අංග රචනය

- ප්‍රශ්න අංක 01 සිට 08 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) වේදිකා නර්තන අංගයක් සඳහා නිරන්තරයෙන් භාවිත කරනු ලබන අංග රචනය හඳුන්වන්නේ කුමන නමින් ද?
   1) චරිතාංග අංග රචනය. 2) ශෛලිගත අංග රචනය.
   3) විකාරරූපී අංග රචනය. 4) සරල අංග රචනය.

2) අංග රචනයට අදාළ මූලික ප්‍රබේද දෙක කුමක් ද?
   1) ඍජු සහ චරිතාංග අංග රචනය.
   2) ශෛලිගත සහ තාත්වික අංග රචනය.
   3) විකාරරූපී සහ ස්වභාවික අංග රචනය.
   4) අධිතාත්වික සහ තාත්වික අංග රචනය.

3) අංග රචනයක දී මුහුණ මූලික වශයෙන් බෙදන කොටස් ගණන,
   1) 4 කි. 2) 5 කි. 3) 6 කි. 4) 7 කි.

4) අංග රචනයේ දී මුහුණ බෙදන කලාප වනුයේ,
   1) නළල, ඇස්, ඇහි බැම, නිකට, කම්මුල්, දෙතොල් ය.
   2) නළල, ඇස්, නාසය, මුඛය, කම්මුල්, නිකට ය.
   3) ඇස්, ඇහිබැම, කම්මුල්, නාසය, දොතොල, නිකට ය.
   4) හිස, නළල, ඇස්, නාසය, කට, කම්මුල් ය.

5) අංග රචනය අයත් වනුයේ සතර අභිනයෙන් කිනම් අභිනයට ද?
   1) ආංගික 2) වාචික 3) සාත්ත්වික 4) ආහාර්ය

6) අංග රචනය සඳහා යොදා ගනු ලබන මූලික අමුද්‍රව්‍ය දෙකක් වන්නේ කුමක් ද?
   1) ග්‍රීස් පේන්ට් සහ පෑන් කේක් 2) පවුඩර් පෆ් සහ ස්පොන්ජ්
   3) අයිබ්‍රෝ පැන්සල් සහ බුරුසු 4) ලිප්ස්ටික් සහ ටිෂූ කඩදාසි

7) සත්ත්ව චරිත සඳහා අංග රචනය කිරීමේ දී මුහුණෙහි හැඩය ගොඩනැගීම සඳහා යොදා ගනු ලබන්නේ,
   1) ක්‍රේප් හෙයාර් 2) නෝස් පුටි 3) ග්‍රීස් පේන්ට් 4) ලිච්නර්

8) සත්ත්ව චරිතයක් අංග රචනය කිරීමේ දී ප්‍රථමයෙන්ම කළ යුතු ක්‍රියාව වන්නේ,
   1) රූප සටහනක් ඇඳ ගැනීමයි. 2) නළුවාගේ මුහුණ හොඳින් සෝදා පිස ගැනීමයි.
   3) පදනම් වර්ණය ආලේප කිරීමයි. 4) සත්ත්වයාගේ මුහුණෙහි හැඩය නිරීක්ෂණය කිරීමයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **කෙටි පිළිතුරු ලියන්න.**

9) අංග රචනය යනු කුමක් ද?

10) අංග රචනය බෙදන ප්‍රධාන කොටස් 04 මොනවා ද?

11) අංග රචනයේ දී මුහුණ බෙදන කලාප ගණන කොපමණ ද? ඒවා මොනවා ද?

12) සරල අංග රචනය යනු කුමක් ද?

13) සරල අංග රචනයක දී භාවිත කරන අංග රචනා ද්‍රව්‍ය 05 ක් නම් කරන්න.

14) මුහුණේ ත්‍රිමාන බව මතු කිරීම යනු කුමක් ද?

15) මුහුණේ ත්‍රිමාන බව මතු කිරීම සඳහා වූ වර්ණ ප්‍රබේද ගණන කොපමණ ද? ඒවා මොනවා ද?

16) එකී වර්ණ ප්‍රබේද අර්ථ දක්වන්න.

17) අංග රචනයක දී යොදා ගන්නා පදනම් ආලේපනයක් නම් කරන්න.

18) චරිතාංග අංග රචනය යනු කුමක් ද?

19) චරිතාංග අංග රචනයකට සුවිශේෂ වූ අංග රචනා ද්‍රව්‍ය 03 ක් නම් කරන්න.

20) ඉහත සඳහන් අංග රචනා ද්‍රව්‍ය තුනෙන් සිදු කරනු ලබන කාර්යයන් මොනවාදැයි සඳහන් කරන්න.

21) අංග රචනාවක් කිරීමේ දී අනුගමනය කරනු ලබන පියවර මොනවා ද?

22) වේදිකා රංගන ශිල්පියෙකුට අංග රචනාවක් අවශ්‍ය වන්නේ මන්දැයි පහදන්න.

23) අංග රචනය කිරීමෙන් ශිල්පියාට ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න.

24) ත්‍රිමාන බව මතු කිරීම සඳහා වර්ණ භාවිත කළ යුතු ආකාරය කරුණු දෙකකින් ලියා දක්වන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk